අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය - 2016
------------------------------------------------------------------------

අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ IV වන කොටසේ 29 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම
-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

--------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 (92) (ආ) ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.3,087,860 ක් වූ ජංගම නොවන වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

----------------------------------

මූල්‍ය ප්‍රකාශන අනුව වෙළඳ ලැබිය යුතු ශේෂය එයට අදාළ උපලේඛන සමඟ සැසඳීමේදී රු.208,000 ක වෙනසක් විය.

### 2.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනත | |
| (i) 5 (1) වගන්තිය | අමාත්‍යවරයා විසින් සාමාජිකයන් 13 දෙනෙකුගෙන් සමන්විත පාලක සභාවක් පත්කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී සාමාජිකයන් 12 දෙනෙකු පමණක් පාලක සභාවට පත්කර තිබුණි. |
| (ii) 5 (2) වගන්තිය | යම් සාමාජිකයකු මාස තුනකට වැඩි කාලයක් පාලක සභා රැස්වීම්වලට සහභාගී නොවන්නේනම් අමාත්‍යවරයා විසින් වැඩ බැලීම සඳහා වෙනත් තැනැත්තෙකු පත්කළ යුතුය. එසේ වුවද එක් සාමාජිකයෙකු සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද රැස්වීම් වාර 12 කින් එකදු රැස්වීමකට හෝ සහභාගී වී නොතිබූ නමුත් ඔහු වෙනුවෙන් වෙනත් අයෙකු පත්කිරීමට කටයුතු කර නොතිබුණි. |

\

| | |
|---|---|
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14.2 වගන්තිය | සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් විසින් ලබානොගත් විවේක නිවාඩු සඳහා රු. 622,234 ක මුදලක් ගෙවා තිබූ අතර, ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

**3.** **මූල්‍ය සමාලෝචනය**

---------------------

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,625,232 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 4,293,560 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.331,672 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම රු.13,382,952 කින් අඩුවී තිබුණද, මුළු වියදම රු.13,714,624 කින් අඩුවීම නිසා වර්ධනයක් ඇති වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු. 1,115,619 ක් වූ අතිරික්තය 2013 වර්ෂයේදී රු. 59,933 ක් දක්වා අඩුවී තිබුණද, 2014 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු. 4,625,232 ක් වී තිබුණි. කෙසේ වුවද අතිරික්තයට සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු සහ ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය ගැලපීමෙන් පසු 2012 වර්ෂයේ රු. 5,958,371 ක් වූ දායකය 2013 වර්ෂය වනවිට රු.4,929,845 ක් දක්වා අඩුවී තිබුණද, 2014 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂය වනවිට රු. 29,593,390 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**4.1** **කාර්යසාධනය**

------------------

2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 3 (අ) ඡේදය ප්‍රකාරව මණ්ඩලයේ කර්තව්‍යයක් ලෙස අදාළ ජාත්‍යන්තර ප්‍රමිති මත පදනම් වූ ජාතික ප්‍රමිතිවලට අනුකූලව, පරීක්ෂණාගාරවලට, සහතිකකරණ සහ පරීක්ෂණ ආයතනවලට, පුහුණුකිරීමේ ආයතනවලට සහ අනුකූලතා තක්සේරු කරගෙනයාමට නියමිත වෙනත් තැනැත්තන්ට ප්‍රතීතන ප්‍රදානය කිරීම දක්වා තිබුණි. එම අරමුණ ඉටුකර ගැනීම සඳහා මණ්ඩලය විසින් හඳුනාගත් ක්ෂේත්‍ර 05 ක් යටතේ ප්‍රතීතනය සිදුකර තිබූ අතර ක්ෂේත්‍ර 03 ක් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පරීක්ෂණාගාර සහ ක්‍රමාංකන ආයතන ප්‍රතීතනය

---------------------------------------------------------

හඳුනාගත් ප්‍රතීතනයන්ට ලක්විය යුතු පරීක්ෂණාගාර සහ ක්‍රමාංකන ආයතන ප්‍රමාණය 184 ක් වුවද, 2016 දෙසැම්බර් 31 වනවිට එයින් ආයතන 72 ක් පමණ ප්‍රතීතනය කර තිබූ අතර ප්‍රතීතන සහතිකය ලබාගෙන තිබූ ආයතන 72 න් ආයතන 11 ක් නැවත ප්‍රතීතනය සහතික ලබාගැනීමෙන් ඉවත්ව ගොස් තිබුණි.

\

(ආ) වෛද්‍ය රසායනාගාර ප්‍රතීතනය

-------------------------------------

හඳුනාගත් ප්‍රතීතනයන්ට ලක්විය යුතු වෛද්‍ය රසායනාගාර 311 ක් පැවතියද, මේ දක්වා මණ්ඩලය විසින් ප්‍රතීතනයට ලක්කර තිබුණේ ආයතන 22 ක් පමණක් වන අතර ප්‍රතීතන සහතිකය ලබාගෙන තිබූ ආයතන 22 න් ආයතන 05 ක් නැවත ප්‍රතීතන සහතික ලබා ගැනීමෙන් ඉවත්ව ගොස් තිබුණි.

(ඇ) සහතික කිරීමේ ආයතන ප්‍රතීතනය

--------------------------------------

(i) 2016 දෙසැම්බර් 31 දින වනවිට නිෂ්පාදිත සහතික කිරීම් ආයතන 02 ක් සඳහා පමණක් ප්‍රතීතන සහතික ලබාදී තිබූ අතර, මෙම ආයතන දෙකම ප්‍රතීතනය අලුත් කිරීම සඳහා නැවත අයදුම්කර නොතිබුණි.

(ii) පුද්ගල සහතික කිරීමේ ආයතන ප්‍රතීතනයට අදාළව 2015 වර්ෂයේදී එක් ආයතනයකට පමණක් ප්‍රතීතන සහතිකය ලබාදී තිබුණි. 2016 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට අනුව නව ප්‍රතීතනයක් සිදුකල යුතු වුවද, කිසිදු ප්‍රතීතනයක් සිදුකර නොතිබුණි.

(iii) පරීක්ෂණ ආයතන ප්‍රතීතනයට අදාළව 2016 දෙසැම්බර් 31 දින වනවිට ආයතන 02 ක් පමණක් ප්‍රතීතන සහතිකය ලබාගෙන තිබූ අතර, එක් ආයතනයක් ඉන් ඉවත්ව ගොස් තිබුණි. තවද නව අයදුම්පත් කිසිවක් ප්‍රතීතනය සඳහා ලැබී නොතිබුණි.

**4.2 කාර්යමණ්ඩල පරිපාලනය**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 ජුනි මාසයේදී මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා විශ්‍රාම ගොස් තිබූ අතර, 2016 ජුනි 02 දින දක්වා කොන්ත්‍රාත් පදනම මත තනතුරේ වැඩ ආවරණය කිරීමට එම නිලධාරියාට අවස්ථා දෙකකදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. අමාත්‍ය මණ්ඩල උපදෙස් පරිදි ස්ථිර සුදුසු නිලධාරියෙක් බඳවා ගැනීමට 2017 මැයි 05 වන දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 සැප්තැම්බර් 01 දින සිට පුරප්පාඩුව පැවති අතිරේක අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීම් සඳහා 2012 වර්ෂයේ සිට සැලසුම් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී පමණක් අවස්ථා 03 කදී පුවත්පත් දැන්වීම් පල කිරීමට රු. 382,790 ක් වැයකර තිබුණි. 2014 ඔක්තෝබර් 14 දිනැති අංක ඩීඑම්එස්/1601 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය ප්‍රකාරව වසරින් වසර කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමේ පදනම මත බඳවා ගැනීමට අනුමැතිය ලැබී තිබියදීත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් බඳවාගැනීම් සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) තාක්ෂණික නිලධාරි (තොරතුරු තාක්ෂණ) තනතුරක් හා නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රතීතන) තනතුරු 02 ක් අනුමත කරගෙන තිබුණද, එම තනතුරු සඳහා බඳවා ගැනීම් 2017 මැයි වන විටත් සිදුකර නොතිබුණු අතර කණිෂ්ඨ කළමනාකරු (ලේකම්) හා රියදුරු තනතුරක්ද පුරප්පාඩුව පැවතුණි.

\

## 4.3 නොවිසඳී ඇති විගණන ඡේද

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රතීතනයන්ට අයදුම් කිරීම කාර්යක්ෂම කිරීම සඳහා මණ්ඩලය විසින් හඳුන්වා දී තිබූ මාර්ගගත පරිගණක පද්ධතියේ සේවා කිරීමේ ගාස්තු වශයෙන් 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු.2,525,454 ක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි. මෙම මෘදුකාංගයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව 2016 මාර්තු 31 දින තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයෙන් (ICTA) විමසා තිබූ අතර මෙම මෘදුකාංගය වර්තමාන අවශ්‍යතාවයන්ට නොගැලපෙන බව එම ආයතනය පෙන්වා දී තිබූ බැවින් මේ සඳහා වැයකරන ලද මුදල ආර්ථික නොවන වියදමක් බවට පත්ව තිබුණි. තවද මෙම මෘදුකාංගය නිවැරදිව ක්‍රියාත්මක නොවීම නිසා එහි අඩුපාඩු නිවැරදි කිරීමට කාර්ය පදනම මත බඳවාගත් නිලධාරියෙකුට 2015 වර්ෂයේ දී මාස 09 ක් සඳහා රු.270,00 ක දීමනාවක් ද ගෙවා තිබුණි.

(ආ) මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් කාර්යාලීය අත්පොතක් කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව 2013 වර්ෂයේදී නිකුත් කර තිබුණි. එය භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය සඳහා 2014 නොවැම්බර් 18 දින ඉදිරිපත් කර තිබුණ ද අනුමැතිය ලැබී නොතිබුණු බැවින් මෙම වාර්තාවේ දින වන විටත් එම අත්පොත ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) කාර්යමණ්ඩල පරිපාලනය | කාර්යමණ්ඩලයේ පෞද්ගලික ලිපිගොනු ක්‍රමවත්ව පවත්වා නොතිබීම සහ චර්යා සටහන් පත්‍ර පෞද්ගලික ලිපිගොනුවලට ඇතුලත් කර නොතිබුණි. |
| (ආ) මෙහෙයුම් පාලනය | ප්‍රතීතන සහතික ලබාගැනීම දිරිමත් කිරීම සහ ලබාදී ඇති ප්‍රතීතන සහතික අලුත් කරවා ගැනීම සම්බන්ධයෙන් ක්‍රමවේදයක් සකස් කර නොතිබීම. |

\